# ඉතිහාසය

## 6 -11 ශ්‍රේණි සඳහා

### විෂය ආවරණ සැලසුම

| වර්ෂය | ශ්‍රේණිය | පාසල පැවැත් වූ දින ගණන | | | | පාසල නොපැවැත් වූ දින ගණන | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | සිංහල හා දෙමල පාසල් | | මුස්ලිම් පාසල් | | සිංහල හා දෙමල පාසල් | | මුස්ලිම් පාසල් | |
| | | බස්නාහිර පළාත් | සෙසු පළාත් | බස්නාහිර පළාත් | සෙසු පළාත | බස්නාහිර පළාත් | සෙසු පළාත | බස්නාහිර පළාත් | සෙසු පළාත් |
| 2020 | | 94 | 117 | 94 | 117 | | | | |
| 2021 | 5,11,13 | 24 | 55 | 19 | 50 | 96 | 65 | 101 | 70 |
| | සෙසු ශ්‍රේණි | 14 | 55 | 9 | 50 | 106 | 65 | 111 | 70 |

2020 හා 2021 වර්ෂවල බස්නාහිර පළාතට සාපේක්ෂව සෙසු පළාත් වැඩි දින ගණනක් පාසල් පැවැත්වූ බැවින්, එම පළාත්වල පාසල් කාලය තුළ ආවරණය කරන ලද පාඩම් සඳහා පුණරීක්ෂණ අභ්‍යාස සිදුකිරීමට යෝජනා කෙරේ.

# 6 ශ්‍රේණිය 2021

# ඉතිහාසය

**(2020 වර්ෂයේ 5 ශ්‍රේණියේ දී ආවරණය කළයුතු විෂය සන්ධාරය)**

පහත වගුවේ දැක්වෙන ආකාරයට 5 ශ්‍රේණියේ තෙවන වාරයට අදාල අපේ අතීත විත්ති තේමාවට අයත් විෂය අන්තර්ගත කොටස් 6, 7, 8 ශ්‍රේණිවලින් ආවරණය වේ. එබැවින් 40% ක පමණ කොටසට අයත් කාලච්ඡේද 16 හයවන ශ්‍රේණියේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදාගැනීමට යෝජනා කෙරේ.

| ශ්‍රේණිය | පාඩම | විෂය අන්තර්ගතය | ආවරණය වන ශ්‍රේණිය හා පාඩම |
|---|---|---|---|
| 5 | අපේ අතීත විත්ති | - රජවරු - පණ්ඩුකාභය, දේවානම්පියතිස්ස, දුටුගැමුණු, එළාර<br>- ස්ථාන - සීගිරිය, මහනුවර දළදා මාලිගාව, ඇඹැක්කය<br>- ස්මාරක - ගල් පාලම, ඉසුරුමුණි පෙම් යුවල<br>- වැවක අංග - කලා වැව<br>- සාහිත්‍ය කෘති - පැරකුම්බා සිරිත | - 6 ශ්‍රේණිය - අපේ අභීත රජවරු<br>- 7 ශ්‍රේණිය - අපේ සංස්කෘතික උරුමය<br>- 7 ශ්‍රේණිය - පසුකාලීන පාලන මධ්‍යස්ථාන<br>- 8 ශ්‍රේණිය - ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික තාක්ෂණය හා කලාව |

2021 වර්ෂයේ 6 ශ්‍රේණියේ සිටින ශිෂ්‍යයා

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | 1 වාරය | 2 වාරය | 3 වාරය | කාලච්ඡේද |
|---|---|---|---|---|---|---|
| ඉතිහාසය ගොඩනැගීමට උපකාරී වන මූලාශ්‍ර අධ්‍යයනයෙන් විචාරාත්මක චින්තනය දියුණු කර ගනියි. | 1.1.ඉතිහාසය යනු අතිතයේ සිට වර්තමානය දක්වා මිනිසාගේ කතන්දරය බව පෙන්වා දෙයි.<br>1.2.මිනිසා පරිහරණය කළ දෑ තුළින් ඉතිහාසය සොයයි. | 1.ඉතිහාසය හැඳින්වීම | පාසල පැවැත් වූ කාලය තුළ ආවරණය කර ඇත. | | | |
| මානව සංවර්ධනයේ විකාශනය පෙන්වා දෙයි | 2.1.පාරිසරික සාධක මත ජීවීන්ගේ ආරම්භය හා මානවයා බිහිවීම විස්තර කරයි.<br>2.2.දේහ ලක්ෂණ වෙනස්වෙමින් මානව පරිණාමය සිදු වූ ආකාරය පෙන්වා දෙයි.<br>2.3.ස්වභාවික පරිසරයට අනුවර්තනය වීමේදී දේහ ලක්ෂණ වෙනස්වන ආකාරය නූතන මිනිසා ඇසුරින් පැහැදිලි කරයි<br>2.4.ආදී මිනිසා මුහුන පෑ අභියෝග ජයගත් ආකාරයඉ විමසා බලා වර්තමානය සමග සසදමින් අනාගත අභියෝගවලට මුහුණදීමේ කුසලතාව වර්ධනය කරගනියි. | 2.ආදි මිනිසා | පාසල පැවැත් වූ කාලය තුළ ආවරණය කර ඇත. | | | |
| මානව සංවර්ධනයේ විකාශනය පෙන්වා දෙයි | 3.1.ලෝකයේ පැරණි ශිෂ්ටාචාර පැහැදිලි කරයි.<br>3.2ලෝකයේ පැරණි ශිෂ්ටාචාර හා ඒවායේ භූගෝලීය ව්‍යාප්තිය සිතියමක ලකුණු කරයි.<br>3.3.පැරණි ශිෂ්ටාචාර හා ඒවායේ භූගෝලීය ව්‍යාප්තිය සිතයම ලකුණු කරයි | 3.ලෝකයේ පැරණි ශිෂ්ටාචාර | | පාසල පැවැත් වූ කාලය තුළ ආවරණය කළ යුතුය. | | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | 1 වාරය | 2වාරය | 3 වාරය | කාලච්ඡේද |
|---|---|---|---|---|---|---|
| මානව සංවර්ධනයේ විකාශනය පෙන්වා දෙයි | 4.1.ශ්‍රී ලංකාවේ මුල් ජනාවාසවල ව්‍යාපතිය හා එහි කාල අවකාශීය විවිධත්වය පහදයි. | 4.ශ්‍රී ලංකාව ජනාවාස වීම | | පාසල පැවැත් වූ කාලය තුළ ආවරණය කළ යුතුය. | | 10 |
| අතීත ශ්‍රී ලාංකික රජවරුන්ගේ චරිතාපදාන හා ජාතික සේවාව අගයමින් ඔවුන්ගේ ශේෂ්ඨත්වය විමසා බලයි | 5.1.1.පණ්ඩුකාභය කුමරු අභියෝග ජයගනිමින් රාජත්වයට පත් වූ ආකාරය විමසා බලයි.<br>5.1.2.පණ්ඩුකාභය රජුගේ කාර්ය සාපල්‍යයතාවය විමසා බලයි.<br>5.2.1.ශ්‍රී ලංකාවට බුදුදහම ගෙනඒම හා එය ව්‍යාප්ත කිරීමෙහිලා දේවානම්පියතිස්ස රජුගේ සේවය මතුකර දක්වයි.<br>5.2.2.සදාචාරවත් සමාජයක් ගොඩනැගීමට බුදුදහමින් ලද ආභාසය ඇසුරින් යහපත් ගුණාංග වර්ධනය කරගනියි.<br>5.3.1.දුටුගැමුණු රජුගේ ශේෂ්ටත්වය පෙන්වා දෙයි.<br>5.3.2.දුටුගැමුණු රජුගෙන් ඉටු වූ සාසනික සේවය අගයමින් යහපත් ගුණාංග චරිතායනය කර ගනියි.<br>5.4.වලගම්බා රජුගේ ශේෂ්ටත්වය අගයමින් එහි ආදර්ශ චරිතායනය කර ගනියි.<br>5.5.වසභ රජුගේ ශ්‍රේෂ්ටත්වය අගයමින් එහි ආදර්ශ චරිතායනය කර ගනියි.<br>5.6.මහසෙන් රජුගේ ශ්‍රේෂ්ටත්වය මතුකර දක්වයි.<br>5.7.ධාතුසේන රජු ඉටුකළ මෙහෙය විස්තර කරයි. | 5. අපේ කීර්තිමත් රජවරු - 1 | | | පාසල ආරම්භ කළ පසු ආවරණය කළ යුතුය | 20 |